(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(1).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2020 නොවැම්බර් 13 සිකුරාදා**

---

**2020 නොවැම්බර් 18 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2010 සිට 2018 දක්වා කොළඹ, රත්නපුර, ගාල්ල, මාතර, නුවර, කුරුණෑගල, යාපනය සහ ගම්පහ යන දිස්ත්‍රික්කවල පිහිටා ඇති ජාතික පාසල්වල 5 ශ්‍රේණියේ සහ 6 ශ්‍රේණියේ සමාන්තර පන්ති සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2010 සිට 2018 දක්වා ඉහත පාසල්වල —

(i) 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු කොපමණද ;

(ii) එම ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත 6 ශ්‍රේණියට ඇතුළත් වූ ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) 6 ශ්‍රේණියට ඇතුළත් වූ මුළු සිසුන් සංඛ්‍යාවෙන්, ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත ඇතුළත් වූ සිසුන්ගේ ප්‍රතිශතය කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත පාසල්වල වර්ෂ 2010 සිට 2018 දක්වා 6 ශ්‍රේණියට ශිෂ්‍යත්ව ප්‍රතිඵල පදනම් කර නොගෙන ප්‍රාථමික අංශයේ සිට පැමිණි සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

51/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රථම කොවිඩ් - 19 ආසාදිත රෝගියා වාර්තා වූ දිනය කවදාද;

(ii) එදින සිට අද දක්වා දිනපතා වාර්තා වූ කොවිඩ් - 19 ආසාදිත රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එදින සිට දිනපතා සිදුකරන ලද පී.සී.ආර්. (PCR - Polymerase Chain Reaction ) පරීක්ෂණ සංඛ්‍යාව කොපමණද;

(iv) කොවිඩ් - 19 රෝගය මැඩපැවැත්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

94/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජෛව අවි භාවිතය ලෝකයේ එකඟතාවය මත තහනම් වුවද විවිධ දේශපාලන හා වෙළඳ උපක්‍රම සඳහා රහසිගතව තවමත් භාවිතා කරන බවත්;

(ii) ශ්‍රී ලංකාව ඇතුළු ඌන සංවර්ධිත රටවල් මෙම ජෛව අවි අත්හදා බැලීම් සඳහා ඉලක්ක වීමේ ඉඩක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජෛව අවි ප්‍රහාර වළක්වා ගැනීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

116/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) එම එක් එක් ඩිපෝවේ දැනට ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස්රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් ඩිපෝව තුළ ඇති සේවක පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවල බස් රථ ඇණි හා මානව සම්පත වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

121/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ මේ දක්වා ගිවිසුම්ගතව ඇති ආයෝජන සංඛ්‍යාව;

(ii) එම ආයෝජනවල වටිනාකම;

(iii) එම ආයෝජනවලින් දැනට වැඩ ආරම්භකර ඇති සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

126/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුලතිවු දිස්ත්‍රික්කයේ, පුදුකුඩිඉරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ප්‍රධාන වැව් අතරින් එකක් වන නංජුන්ඩාන්කුලම් වැව ප්‍රතිසංස්කරණය කිරීමට පසුගිය රජය විසින් අනුමතිය ලබාදී, එයට මිලියන 40ක මුදල් ප්‍රතිපාදන ද වෙන්කරන ලද නමුත්, අඛණ්ඩව ඇද වැටුණු වර්ෂාව හේතුවෙන් මෙම ප්‍රතිසංස්කරණ වැඩකටයුතු සිදුනොකර ප්‍රතිපාදන ආපසු යවා ඇති බවත්;

(ii) මෙම වැව යටතේ බොහෝ කුඹුරු හා ගොඩඉඩම් තිබෙන අතර ග්‍රාමීය ජනතාව තම ජීවනෝපාය සඳහා මෙම වැව කෙරේ විශ්වාසය තබාගෙන ඇති බවත්;

(iii) නංජුන්ඩාන්කුලම් වැව් බැම්මේ තිබෙන අනවශ්‍ය ගස් කපා ඉවත් කිරීම සඳහා දැව සංස්ථාවට අනුමතිය ලබා දී ඇතත්, ප්‍රවාහනය සඳහා මාර්ගය අබලන් වී ඇති බැවින් මෙතෙක් එය ක්‍රියාත්මක වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, මෙම නංජුන්ඩාන්කුලම් වැව ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩකටයුතු සඳහා මුදල් වෙන්කරන දිනය කවරේද;

(ii) ප්‍රවාහනය සඳහා මාර්ගය පිළිසකර කර, ඉහත වැව ප්‍රතිසංස්කරණයට අදාළ වැඩ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

151/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 14, ශ්‍රී සංඝබෝධි මහා විද්‍යාලයේ ඇති තෙමහල් ගොඩනැගිල්ලේ වහලය දිරාපත්ව එහි කොටසක් කඩා වැටී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් සිසු දරුවන් අනාරක්ෂිතභාවයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

221/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ ඉලෙක්ට්‍රොනික උපකරණ ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉලෙක්ට්‍රොනික උපකරණ ආනයනය කළ රටවල් කවරේද;

(iii) එම ඉලෙක්ට්‍රොනික උපකරණ ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ඉලෙක්ට්‍රොනික උපකරණ ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 නොවැම්බර් 19 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

7/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා විනාශ කර ඇති පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් කවරේද;

(iii) එම පුරාවිද්‍යා ස්ථාන විනාශ කිරීමට හේතු කවරේද;

(iv) අදාළ පුරාවිද්‍යා ස්ථාන විනාශ කළ පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(v) ඔවුන්ට ලබාදුන් දඬුවම් කවරේද;

(vi) විනාශ කර ඇති, එහෙත් ඊට වගකිව යුතු පුද්ගලයන් හඳුනා නොගත් පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(vii) රටක ඓතිහාසික අභිමානය සුරකින පුරාවිද්‍යා ස්ථාන විනාශ කිරීමට එරෙහිව ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

52/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැනට විදේශගතව සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශ්‍රමිකයන් සේවයේ නියුතු රටවල්වල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් රටේ සේවයේ නියුතු ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොවිඩ් - 19 වසංගතය නිසා පීඩාවට පත් වී සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුබසාධනය සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

(ii) ඔවුන් මෙරටට ගෙන්වා ගැනීමට අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

99/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ විල්පත්තු ජාතික වනෝද්‍යානය ප්‍රමුඛ වනාන්තර වැස්ම මානව ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශ වන බවත්;

(ii) මේ වනවිටත් උතුරු මැද පළාත අර්ධ කාන්තාර තත්ත්වයට පත්වී ඇති බවත්;

(iii) මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ සමස්ත දේශගුණයට බලපා ඇති බවත්;

(iv) එහෙයින් නිරන්තරයෙන් ශ්‍රී ලංකාවේ කුමන හෝ පළාතක් ගංවතුර, නියගය, නාය යෑම් ආදී ස්වභාවික ව්‍යසනවලින් පීඩා විඳින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පරිසරය සුරැකීමේ ජාතික ප්‍රතිපත්තින් සකස් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස පිළිබඳ විද්වත් කමිටුවක් හරහා අධ්‍යයනයක් සිදු කිරිම සුදුසු යැයි එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, එම අධ්‍යයනය සිදු කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

117/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සේවය කළ/කරන එක් එක් නිලධාරියාගේ ලිපිනය සහ නිලධාරියාට මාසිකව ගෙවන ලද වැටුප්, දීමනා හා වෙනත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ඔවුන් ලැබූ වැටුප් හා වෙනත් වරප්‍රසාදවලට සාපේක්ෂව, ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීමට ඔවුන්ගේ පාලන කාලය තුළ සමත් වී නැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව තවදුරටත් වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

122/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ යටිතල පහසුකම් සංවර්ධනයේදී ඉවත් කරන ලද පොල් ගස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොල් ගස් ඉවත් කිරීමේදී ඒවා ලබා දෙන ලද පාර්ශ්වයන් කවරේද;

(iii) ඒ සඳහා භාවිතා කළ ක්‍රමවේදය කවරේද;

(iv) එක් පොල් ගසකට ලබා දුන් මිල කොපමණද;

(v) එමගින් උපයා ගත් මුදල්, භාරයේ පවතින ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

152/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 14, සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ පිහිටි බ්ලූමැන්ඩල් විද්‍යාලයේ සිසු දරුවන් 400ක් පමණ අධ්‍යාපනය ලබන අතර එහි මලාපවහන පද්ධතිය පිළිසකර නොකිරීම හේතුවෙන් ගලි පියන් වෙනුවට ලෑලි යොදා වසා ඇති බවත්;

(ii) එම සිසු දරුවන් සඳහා නිසි වැසිකිළි පහසුකම් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

222/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ ඖෂධ ප්‍රමාණය කොපමණද;

(ii) එම ඖෂධ ආනයනය කළ රටවල් කවරේද;

(iii) එම ඖෂධ ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ඖෂධ ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

307/2020

ගරු වේලු කුමාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, දෙමළ මාධ්‍ය පාසල්වල සිටින ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අයත් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ඔවුන් මේ වනවිට සේවයේ නියුතු පාසල්වල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මහනුවර දිස්ත්‍රික්කය තුළ සිටින —

(i) විදුහල්පති සේවයේ ශ්‍රේණිධාරී පත්වීමක් ලැබුණද ශ්‍රේණියට අදාළව විදුහල්පති පත්වීමක් නොලද නිලධාරීන් සංඛ්‍යාව;

(ii) විදුහල්පති සේවයේ සුදුසුකම් නොමැති, එහෙත් දෙමළ මාධ්‍ය පාසල්වල විදුහල්පතිවරුන් ලෙස පත්වීම් ලබා ඇති නිලධාරීන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (ආ)(ii)හි සඳහන් පත්වීම් ලබාඇති ගුරුවරුන්ගේ විස්තර සහ ඔවුන් මේ වනවිට සේවය කරන පාසල් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

**2020 නොවැම්බර් 20 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

19/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ අප්‍රේල් මාසයේදී, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් රේඩාර් රිසීවරයක් හා ඇන්ටනා ස්කෑනරයක් අලුත්වැඩියාව සඳහා චීනයට යවා තිබූ බවත්;

(ii) එම භාණ්ඩ අස්ථානගත වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම භාණ්ඩ ප්‍රවාහනය කිරීමට භාරගත් සමාගම කවරේද;

(ii) එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් කවුරුන්ද;

(iii) එම සමාගම තවමත් ශ්‍රී ලංකාවේ කවර හෝ රාජ්‍ය ආයතනයකට සේවා සපයන්නේද;

(iv) එම භාණ්ඩ අස්ථාන ගත වීමෙන් සිදුවූ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

65/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාතික පාසලක විදුහල්පති ධුරයක් දැරීමට තිබිය යුතු සුදුසුකම් කවරේද;

(ii) එසේ නියමිත සුදුසුකම් සහිත විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iii) එසේ නියමිත සුදුසුකම් සපුරා නොමැති විදුහල්පතිවරු සිටින පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) සෑම ජාතික පාසලක් සඳහාම නියමිත සුදුසුකම් සහිත විදුහල්පතිවරුන් පත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

109/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.01 දින සිට 2019.12.31 දක්වා වූ කාලය තුළ ආනයනය කරන ලද දුම්රිය මැදිරි, දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල සංඛ්‍යාව;

(ii) ඒ සඳහා වැය කළ මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙලෙස ආනයනය කළ ඉහත දුම්රිය මැදිරි, දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටලවලින් ඇතැම් ඒවා ශ්‍රී ලංකාවේ ධාවනයට නුසුදුසු බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, ඉහත දුම්රිය මැදිරි, දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල මෙරටට ආනයනය කිරීමේ ක්‍රියාදාමය වෙනුවෙන් පත් කරන ලද ටෙන්ඩර් හා තාක්ෂණික කමිටු වල සාමාජිකයන්ගේ නම් හා තනතුරු;

(ii) ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකාව තුළ දුම්රිය මැදිරි නිෂ්පාදනය ආරම්භ කරන දිනය කවරේද;

(ii) ඒ අනුව, රජයට ඉතිරිකර ගත හැකි මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

164/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2020 සිට 2024 දක්වා කාලය තුළ රජය විසින් ගෙවීමට ඇති, දේශීය හා විදේශීය ණය මුදල්, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ණය ලබාගත් දිනය හා ව්‍යාපෘතීන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම ණය මුදල්වල වාරික ගෙවීම සඳහා රජය විසින් සකසා ඇති වැඩපිළිවෙළ කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

223/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ සිමෙන්ති ප්‍රමාණය කොපමණද;

(ii) එම සිමෙන්ති ආනයනය කළ රටවල් කවරේද;

(iii) සිමෙන්ති ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට සිමෙන්ති ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

435/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දිනකට මාර්ග අනතුරු විශාල ප්‍රමාණයක් සිදු වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම මාර්ග අනතුරු වලින් දිනකට මිය යන පුද්ගලයන් සංඛ්‍යාව දළ වශයෙන් කොපමණද;

(ii) 2018 හා 2019 වර්ෂවල සිදු වූ මාර්ග අනතුරු වලින් මිය ගිය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාර්ග අනතුරු අවම කර ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා පොලිසිය හි පවතින වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මාර්ග අනතුරු අවම කිරීම පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත්කර තිබූ බව දන්නේද;

(ii) එම තේරීම් කාරක සභාව මගින් ලබා දී තිබූ නිර්දේශ හා නිගමන සැලකිල්ලට ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

448/2020

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන මද්‍රසා පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2019 වර්ෂයේදී සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු මෙම මද්‍රසා පාසල් පිළිබඳ විශාල කතිකාවක් සමාජය තුළ ඇති වී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙම මද්‍රසා පාසල් නියාමනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර;

(ii) එම පාසල් සම්බන්ධව වත්මන් රජයේ ස්ථාවරය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

456/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති, කලාවැව ජලාශයේ සිට තිසාවැව ජලාශය දක්වා ජලය රැගෙන යන පැරණි යෝධ ඇල වල්බිහිවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ඇල මාර්ගය ශුද්ධ පවිත්‍ර කර යථාවත් කිරීමට වැඩපිළිවෙළක් තිබේද ;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) එම වැඩපිළිවෙළ ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2020 නොවැම්බර් 21 සෙනසුරාදා
# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ නියෝග,— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 112 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2019 අප්‍රේල් 08 දිනැති අංක 2118/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.11.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2020 නොවැම්බර් 25 බදාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

18/2020

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා නව බස් රථ 2200ක් ගෙන්වා ඇති බවත්;

(ii) මෙම බස් රථ ලබා දී ඇත්තේ කල්බදු ක්‍රමය යටතේ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේ සිට එම කල්බදු ගෙවීම් නතර කර තිබේද;

(ii) එසේ නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

107/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විනාකිරි නිෂ්පාදනයට යොදා ගනු ලබන රාවල ගුණාත්මකභාවය නියාමනයට ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විනාකිරි නිෂ්පාදනය සඳහා කෘත්‍රිම රා යොදා ගන්නා බවත්;

(ii) රසායනික විෂ සහිත මෙම කෘත්‍රිම රා භාවිතය ජනතාවගේ සෞඛ්‍යයට තර්ජනයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) විනාකිරි නිෂ්පාදනය සඳහා කෘත්‍රිම රා යොදා ගැනීම වැළැක්වීමට ගනු ලබන පියවර සඳහන් කරන්නේද;

(ii) කෘත්‍රිම රාවලින් නිෂ්පාදනය කරනු ලබන විනාකිරි භාවිතා කිරීම හේතුවෙන් ඇතිවිය හැකි කෙටි කාලීන හා දිගු කාලීන රෝගාබාධයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

192/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත්වල පාලම් 1000ක් ඉදිකිරීමේ වැඩසටහන ඔබ අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද වැඩසටහනක් බවත්;

(ii) එම සැලැස්ම එම ප්‍රදේශවල අවශ්‍යතාවයන්ට නොගැලපෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම වැඩසටහන යටතේ —

(i) උතුරු පළාතේ එක් එක් දිස්ත්‍රික්කය තුළ ඉදිකරන ලද පාලම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඉදිකිරීම්වලට සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලම ඉදිකිරීමේ වැඩසටහන සඳහා වන සැලසුම් අදාළ ප්‍රදේශවලට ගැලපෙන අයුරින් සකස් කරනු ලැබුවේද;

(ii) නොඑසේ නම්, විදේශයකදී සකස් කරන ලද සැලසුම් අනුව ක්‍රියාත්මක කරනු ලැබුවේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) මෙම වැඩසටහන යටතේ කිළිනොච්චි දිස්ත්‍රික්කය සඳහා —

(i) ඉදිකිරීමට යෝජිත පාලම් සංඛ්‍යාව;

(ii) මුදල් වෙන් කරන ලද පාලම් සංඛ්‍යාව;

(iii) මුදල් වෙන් කරන ලද පාලම් අතරින් වැඩ අවසන් කළ සංඛ්‍යාව;

(iv) මුදල් වෙන් කරන ලද පාලම් අතරින් වැඩ අවසන් නොකළ සංඛ්‍යාව;

(v) තවදුරටත් ඉදිකිරීමට ඇති පාලම් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

218/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ කව්පි ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම කව්පි ආනයනය කළ රටවල්වල නම් කවරේද;

(iv) එම කව්පි ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට කව්පි ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

342/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2018/05/11 දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමක් අනුව විගණන පරීක්ෂක සේවයේ II ශ්‍රේණියට විගණන පරීක්ෂකවරුන් බඳවා ගැනීම - 2018 සඳහා විවෘත තරග විභාගයක් පැවැත්වූ බවත්;

(ii) එම තරග විභාගය 2018 ඔක්තෝම්බර් 14, 20 සහ 21 යන දිනයන්හි විභාග මධ්‍යස්ථාන කිහිපයකදී පැවැත්වූ බවත්;

(iii) එකී තරග විභාගයේ ප්‍රතිඵල මේ වනතෙක් නිකුත් කර නොමැති බවත්;

(iv) එකී තරග විභාගය පවත්වා මේ වනවිට අවුරුදු 2ට වැඩි කාලයක් ඉක්මවා ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී විභාගයේ ප්‍රතිඵල කඩිනමින් නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ට අදාළ පත්වීම් කඩිනමින් ප්‍රදානය කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

348/2020

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නීතිමය තත්ත්වය කෙසේ වුවත්, සංවේදී පරිසර පද්ධතියක මාර්ගයක් ඉදිකරන විට ඒ සඳහා පරිසර බලපෑම් අධ්‍යයනයක් සිදු කළ යුතු බව පරිසරවේදීන් ඇතුළු බහුතර ජනතාවගේ අදහස බැවින් එවැනි අධ්‍යයනයක් සිදු කළ යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, සංවේදී පරිසර පද්ධතියක් හා ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරය හරහා ලංකාගම නමැති ග්‍රාමය වෙත පාරක් කැපීම සඳහා එවැනි අධ්‍යයනයක් සිදු කර තිබේද;

(ii) නොඑසේ නම්, එවැනි අධ්‍යයනයක් සිදු කිරීමට අපේක්ෂා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (අ)හි සඳහන් අදහස පිළිනොගන්නේ නම්, එයට හේතුව කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

420/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට බොහෝ දුරට වැඩ නිමවෙමින් පවතින "විසල් දඹුල්ල" ජල ව්‍යාපෘතිය යටතේ ගෘහ ජල සම්බන්ධතා ලබා දීමට නියමිත ගලේවෙල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කවරේද;

(ii) එම ග්‍රාම නිලධාරි වසම්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය යටතේ ගෘහ ජල සම්බන්ධතාවයන් ලබා දීම සඳහා ආවරණය නොවන ග්‍රාම නිලධාරී වසම් ගණනාවක් ගලේවෙල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල තිබෙන බව දන්නේද;

(ii) එම ග්‍රාම නිලධාරී වසම්වල නම් කවරේද;

(iii) එම ග්‍රාම නිලධාරි වසම්වල ගෘහ ජල සම්බන්ධතා ලබා නොදෙන ගම්මාන සංඛ්‍යාව කවරේද;

(iv) එම ගම්මානවල නම් කවරේද;

(v) එම ගම්මාන සඳහා ද ගෘහ ජල සම්බන්ධතා ලබාදීමට ඉහත ව්‍යාපෘතිය යටතේ පියවර ගන්නේද;

(vi) නොඑසේ නම්, ඒ සඳහා විකල්ප යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්නේද;

(vii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

492/2020

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ, වනාතවිල්ලුව, එළුවන්කුලම ප්‍රදේශයේ, වනාන්තරයක් ගිනි තබා එළිපෙහෙළි කර විනාශ කර ඇති බවට මාධ්‍ය මඟින් වාර්තා වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම විනාශය සිදු කරන ලද භූමියේ ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වල අයිතිය රජය සතුව පවතින්නේද;

(iii) නොඑසේ නම්, එම ඉඩම්වල අයිතිය සතු පාර්ශ්වයන් කවරේද;

(iv) ඉහත වනාන්තරය විනාශ කිරීමට කටයුතු කළ පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(v) එම පුද්ගලයන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2020 නොවැම්බර් 26 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

50/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති රජයේ පාසල් සඳහා අනුමත ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් විෂයයට අදාළව එම ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට සේවයේ නියුතු ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කය තුළ එක් එක් විෂයයට අදාළව දැනට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම ගුරු පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

123/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් පවරා ගෙන ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් පවරා ගැනීම සිදු කරන ලද ආයතන කවරේද;

(iii) එම ඉඩම් පවරා ගත් දිනය කවරේද;

(iv) එම ඉඩම් සඳහා ගෙවන ලද වටිනාකම කොපමණද;

(v) එම ඉඩම්වල වටිනාකම තක්සේරු කරන ලද ක්‍රමවේදය කවරේද;

(vi) දැනට එම ඉඩම්වල ඇති පොල් වගාවන්වල නඩත්තුව හා එම ඵලදාවන් ලබාගැනීම සිදු කරන ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

414/2020

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්තමානයේදී, රැඳවුම් නිවාසවල (රිමාන්ඩ් නිවාසවල), සහතික කළ පාසල්වල, භාරගැනීමේ නිවාසවල සහ නිවර්තන නිවාසවල ආයතන ගතකර ඇති ළමයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සඳහන් එක් එක් ආයතනයට අදාළව —

(i) ළමයෙකු රැඳී සිටින සාමාන්‍ය කාල පරිච්ඡේදය;

(ii) රජය විසින් එක් ළමයෙකු සඳහා වෙන් කරනු ලබන මුදල;

(iii) අනුයුක්ත කර ඇති කාර්යමණ්ඩලවල කාණ්ඩ සහ මූලික සුදුසුකම්;

(iv) කාර්යමණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව සහ ළමයින් සංඛ්‍යාව අතර අනුපාතය;

(v) ළමයින් නැවත ප්‍රජාව තුළ සමාජගත කිරීම සඳහා ගනු ලබන පියවර;

(vi) මෙම ළමයින්ගේ සුභසිද්ධිය තහවුරු කිරීම සඳහා ගනු ලබන පියවර;

(vii) මෙකී ආයතන අධීක්ෂණය කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටි;

කවරේද යන්න ද එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2015 සිට 2019 දක්වා කාල පරිච්ඡේදය තුළ —

(i) ඉහත කී එක් එක් ආයතනයට ඇතුළු වූ සහ පිට වී ගිය;

(ii) එකී ආයතනවලින් පිටව ගොස් නිසි වැටුප් සහිත රැකියාවන්හි නිරතව ප්‍රජාව තුළ සුරක්ෂිතව ජීවත්වන ළමයින් සංඛ්‍යාව;

එතුමා වැඩිදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

436/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඉඩම් නොමැති හා දැනටමත් පදිංචි ඉඩමට ඔප්පුවක් නොමැති විශාල පවුල් සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ සිටින බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම පවුල් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන තිබේද;

(ii) පදිංචි ඉඩමට ඔප්පුවක් නොමැති පවුල් සඳහා ඔප්පු ලබා දීමට පියවර ගන්නේද;

(iii) පදිංචිය සඳහා ඉඩම් නොමැති පවුල් වෙනුවෙන් ඉඩම් ලබා දීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ඉඩම් හඳුනාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

481/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව, පරණ එළුවන්කුලම ප්‍රදේශයේ කාලයක් තිස්සේ කැනීම් බලපත්‍ර නොමැතිව නීතිවිරෝධී ලෙස වැලි කැනීමේ ජාවාරම සිදුකරගෙන යන බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම නීති විරෝධී වැලි කැනීම් ජාවාරම මැඩපැවැත්වීමට අමාත්‍යාංශය විසින්,

(i) මෙතෙක් ගෙන ඇති පියවර;

(ii) ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත පියවර;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

507/2020

ගරු ජගත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් දේශපාලන පදනමින් සමෘද්ධි සහනාධාර ලබා දුන් බව පිළිගන්නේද;

(ii) ඒ හේතුවෙන්, සුදුසුකම් ලැබූ විශාල පිරිසකට එම සහනාධාරය නොලැබුණු බව පිළිගන්නේද;

(iii) "සෞභාග්‍යයෙ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව සමෘද්ධි සහනාධාර නොලැබුණු අයට ඒවා ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දින වකවානු කවරේද;

(v) සමෘද්ධි සහනාධාරවල වටිනාකම වැඩි කිරීමට පියවර ගන්නේද;

(vi) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමෘද්ධි ව්‍යාපාරය ආරම්භ කර වර්ෂ 25කට ආසන්න වුවද, සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට කිසිදු උසස්වීමක් ලැබී නොමැති බව පිළිගන්නේද?

(ii) එම උසස්වීම් ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්තමාන රජය විසින් සමෘද්ධි ව්‍යාපාරයේ හා සමෘද්ධි නිලධාරින්ගේ ගැටලු විසඳීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා කිහිපයක් ඉදිරිපත් කර ඇති බව දන්නේද?

(ii) එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මගින් ඉදිරිපත් කළ ගැටලු;

(iii) මේ වනවිට ඒ පිළිබඳව ගෙන ඇති පියවර;

කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

524/2020

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රජයේ පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල් අතරින් ස්ථිර විදුහල්පතිවරු සිටින පාසල් සංඛ්‍යාව;

(iii) මේ වනවිට වැඩබලන විදුහල්පතිවරු සිටින පාසල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි රජයේ පාසල් සඳහා ස්ථිර විදුහල්පතිවරුන් පත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

732/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රටකට භාණ්ඩ අලෙවිය සඳහා ඇති පහසුම ක්‍රමය "ඊ කොමර්ස්" (E - Commerce) වෙබ් අඩවියක් හරහා අලෙවිය වන බැවින් මේ සඳහා ලෝකයේ මිලියන 305ක පමණ ජනතාවක් "පේ පැල්" (PayPal) "ගේට්වේ" (Gateway) භාවිතා කරන බවත්;

(ii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදන විදේශයන්ට අලෙවියට ඉහත ක්‍රමය භාවිතා කළ හැකි බවත්;

(iii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම ක්‍රමය ශ්‍රී ලංකාවේ විවෘත කර නොතිබීමෙන් භාණ්ඩයක්/සේවාවක් විදේශයන්ට අලෙවි කර, විදේශ විනිමය ලැබිය හැකි ආදායම් මාර්ග ඇහිරී ඇති බවත්;

(iv) ශ්‍රී ලංකාවේ ඇති "ඔන්ලයින්" (Online) ක්‍රමයට සේවා සපයන ආයතන, විදේශයන්වල ලිපිනයන් භාවිතා කරමින්"පේපැල්" (PayPal) ගිණුම් සකස් කරන බවත්;

(v) මේ හේතුවෙන් ශ්‍රී ලංකාවට ලැබිය යුතු විශාල මුදලක්, කොමිස් වශයෙන් විදේශයන්ට ගෙවීමට සිදුව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ නිෂ්පාදන/සේවාවන් "ඔන්ලයින්" (Online) ක්‍රමයට විදේශයන්ට අලෙවි කිරීම සඳහා පවතින බාධාවන් ඉවත් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 නොවැම්බර් 27 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

20/2020

ගරු හේෂා විතානගේ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරීන්, මධ්‍යම මට්ටමේ කාර්මික සේවාවට අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් චක්‍රලේඛ අංක 22/2002 නිකුත් කර ඇති බවත්;

(ii) එහෙත් සබරගමු පළාත් සෞඛ්‍ය නිලධාරීන් හා සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිලධාරීන් ඉහත චක්‍ර ලේඛයට අනුව කටයුතු නොකරන බවත්;

(iii) මේ සම්බන්ධව වූ සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයාගේ නියෝගය, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කෙමිෂන් සභාව විසින් නොසළකා හැර ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) එසේ සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයාගේ නියෝගය, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අවස්ථා තුනකදීම නොසලකා හැරීමට හේතු කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සබරගමුව පළාත් මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරීන්ට ගෙවිය යුතු මුළු හිඟ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ඉදිරියේ දී එම මුදල් ගෙවීමට පියවර ගන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

110/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේනික ඖෂධීය ශාක විශාල ප්‍රමාණයක් ඇති බවත්;

(ii) ඇතැම් ශාකවල ඇති රසායනික ද්‍රව්‍ය හා ජානමය කොටස් සඳහා පේටන්ට් බලපත්‍රය ලබා ගෙන නොමැති බවත්;

(iii) ඒ හේතුවෙන් මෙරටට විශාල ආර්ථික පාඩුවක් සිදුවන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට ආවේනික ඖෂධීය ශාක පිළිබඳ සමීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, ශ්‍රී ලංකාවට ආවේනික ඖෂධීය ශාක සංඛ්‍යාව කවරේද;

(iii) ඒ අතරින් පේටන්ට් බලපත්‍රය හිමි ශාක සංඛ්‍යාව කවරේද;

(iv) ඒවායේ නම් කවරේද;

(v) පේටන්ට් බලපත්‍ර නොමැති ඖෂධීය ශාක සඳහා එම බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) පේටන්ට් බලපත්‍ර හිමි ශාක යොදා ගෙන නිපදවන ඖෂධ හෝ වෙනත් නිෂ්පාදනවලින් වාර්ෂිකව රජයට ලැබෙන විදේශ විනිමය ආදායම කොපමණද;

(ඇ) (i) පේටන්ට් බලපත්‍ර හිමි ශාක යොදා ගෙන නිපදවන ඖෂධ හෝ වෙනත් දේශීය නිෂ්පාදන ඉහළ නැංවීමට:

(ii) නිෂ්පාදන වෙනුවෙන් විදේශ විනිමය ආදායම වැඩි කිරීමට;

ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

153/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 15, ආවේ මරියා විද්‍යාලයේ කතෝලික ධර්මය හා පෙරදිග සංගීතය විෂයයන් සඳහා ද ප්‍රාථමික පොදු අංශයේද ගුරු පුරප්පාඩු 01 බැගින් පවතින බවත්;

(ii) වැසි ජලය බැස යාමේ නිසි ක්‍රමවේදයක් නොමැතිකම හේතුවෙන් මෙම විද්‍යාලයේ ඇති කුඩා ක්‍රීඩාංගණය වැසි ජලයෙන් යටවීමෙන් සිසු දරුවන්ගේ ක්‍රීඩා කටයුතුවලට බාධාවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ගැටලු විසඳීම සඳහා අමාත්‍යාංශය මගින් ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

225/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ තඹ ප්‍රමාණය කොපමණද;

(ii) එම තඹ ආනයනය කළ රටවල් කවරේද;

(iii) එම තඹ ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට තඹ ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

449/2020

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමාජයේ ඉමහත් කතිකාවකට ලක් වූ බැටිකලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය ස්ථාපිත කළ දිනය;

(ii) ඒ සඳහා මුදල් වැය කළ පුද්ගලයින් හා ආයතනවල නම්;

(iii) එහි පාලක මණ්ඩලයේ සිටි පුද්ගලයින්ගේ නම්;

(iv) එම ආයතනය විසින් පැවැත්වීමට නියමිතව තිබූ පාඨමාලා සංඛ්‍යාව;

(v) එම පාඨමාලාවල නම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ආයතනයේ පැවැත්වීමට නියමිත පාඨමාලා අතරට ශරියා නීතිය පිළිබඳ පාඨමාලාවක් ඇතුළත් කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත ආයතනය සම්බන්ධව වත්මන් රජයේ ස්ථාවරය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

452/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව නගරයේ දීර්ඝ කාලයක් තිස්සේ ව්‍යාපාර කරමින් වාසය කරන ව්‍යාපාරිකයන්ගේ ඉඩම්වලට හා ජනතාවගේ ඉඩම්වලට ඔප්පු නොලැබීම හේතුවෙන් ඔවුන් අසීරුතාවයට පත්වී ඇති බව ඔබතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඉහත ඉඩම් සඳහා ඔප්පු ලබාදීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග;

(ii) එම ක්‍රියාමාර්ගවල වර්තමාන ප්‍රගතිය;

(iii) එම ඉඩම් සඳහා ඔප්පු ලබා දෙන දිනය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

607/2020

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ජ්‍යෝෂ්ඨ පුරවැසි දීමනාව ලබා දෙනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දීමනාව ලබා ගැනීම සඳහා අයදුම් කර දැනට පොරොත්තු ලේඛනයේ සිටින සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ "සෞභාගයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව, ජ්‍යෝෂ්ඨ පුරවැසි දීමනාව රු.2000.00 සිට රු. 2500.00 දක්වා වැඩි කිරීමට ක්‍රියා මාර්ග ගෙන තිබේද;

(iv) එසේ නම්, එම වැඩි කරනු ලබන දීමනාව ලබා දෙන දිනය කවරේද;

(v) විදේශ වන්දනා ගමන් සඳහා ජ්‍යෝෂ්ඨ පුරවැසියන්ට අඩු පොලියට ණය ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(vi) එසේනම්, එය සම්බන්ධීකරණය කරනු ලබන ආයතන කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

634/2020

ගරු සාණක්කියා රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති මණ්ඩූර් ප්‍රදේශයේ ජල ටැංකියට අදාළ ඉදිකිරීම් ජල සම්පාදන මණ්ඩලයට මුදල් නොගෙවීම හේතුවෙන් අත්හිටුවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම ජල ටැංකියෙන් ජලය සපයන ප්‍රධාන කොට්ඨාස හතරකට ඇති වන අපහසුතා කවරේද;

(ii) ජලය නොමැතිව දුෂ්කරතාවට පත්ව ඇති, ජල සැපයුම් ලබා දීමට ජල නළ එළිය යුතු ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගම්මානවල නම් කවරේද;

(iv) එම ගම්මානවල ජීවත්වන ජලය නොමැතිව පීඩා විඳින පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 නොවැම්බර් 28 සෙනසුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

66/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 වර්ෂයේ සිට මේ වන තෙක් දුම්රිය ප්‍රවාහනයට එකතු කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම එක් එක් දුම්රිය මැදිරි අතරින් දේශීයව නිෂ්පාදන කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව හා විදේශීය රටවලින් ආනයනය කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අප රට තුළ දුම්රිය මැදිරි නිෂ්පාදනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

193/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ ස්ථිරව පදිංචි පවුල්වලට හිමි ඉඩම් ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සින්නක්කර ඔප්පු හිමි පවුල් සංඛ්‍යාව සහ එම පවුල්වල සාමාජිකයන් සංඛ්‍යාව;

(ii) ඉඩම් බලපත්‍ර ඇති පවුල් සංඛ්‍යාව සහ එම පවුල්වල සාමාජිකයන් සංඛ්‍යාව;

(iii) බලපත්‍ර සහිත කුඹුරු ඉඩම් ප්‍රමාණය සහ ගොඩ ඉඩම් ප්‍රමාණය;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ වර්ෂ 60කට වඩා වැඩි කාලයක් ජීවත් වන ජනතාවට සින්නක්කර ඔප්පු මෙතෙක් ලබා දී නොමැති බවත්;

(ii) යුද්ධයෙන් පීඩාවට පත් එම ජනතාවට ඔප්පු ලබා නොදීම හේතුවෙන් බැංකුවලින් හා මූල්‍ය ආයතනවලින් උකස් හා ණය පහසුකම් ලබා ගැනීම දුෂ්කර වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ ජනතාවට සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

(ii) මේ වනවිට සින්නක්කර ඔප්පු හෝ බලපත්‍ර නොමැතිව ජීවත්වන ඉඩම් හිමි පවුල් සංඛ්‍යාව සහ එම පවුල්වල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

350/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට සහකාර පොලිස් අධිකාරි තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පොලිස් කොස්තාපල් තනතුරේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර දක්වා සහ සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරු දක්වා වූ තනතුරුවල පුරප්පාඩු පවතින්නේද;

(iii) එම තනතුරු සඳහා මෑතකදී කාලානුරූපී උසස්වීම් ලබා දීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(iv) ඉහත තනතුරු සඳහා උසස්වීම් ලබා දීමේදී එම තනතුරු සඳහා සිටිය යුතු අනුමත නිලධාරින් සංඛ්‍යාව සම්බන්ධයෙන් සළකා බැලුවේද?

(v) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සහ නියෝජ්‍ය පොලිස්පති තනතුරේ වැඩ ආවරණය කිරීම සඳහා මෑතකදී කාලානුරූපී උසස්වීම් ලබාදීමේදී එම තනතුරු සඳහා සිටිය යුතු අනුමත නිලධාරින් සංඛ්‍යාව නොසළකා එම ප්‍රමාණය ඉක්මවා වර්ෂ දෙක හමාරක සේවා කාලයක් ඇති නිලධාරින්ට උසස්වීම් ලබා දුන් ක්‍රමවේදය කවරේද;

(vi) ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ සිට සහකාර පොලිස් අධිකාරී තනතුර දක්වා කාලානුරූපී උසස්වීම් ලබාදීමේදී, ඉහත (v)හි ක්‍රමවේදය අනුගමනය නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

426/2020

ගරු ජගත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වනවිට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරන—

(i) සමෘද්ධි සංවර්ධන නිලධාරින්;

(ii) සමෘද්ධි කළමණාකරුවන්;

(iii) වෙනත් නිලධාරින්;

සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමෘද්ධි සංවර්ධන නිලධාරි තනතුරෙහි පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතින බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිරවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඒවා පුරවන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ හා සමෘද්ධි ව්‍යාපාරයේ ගැටලු විසඳන බව "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ දක්වා ඇති බවත්;

(ii) 2015 වර්ෂයට පෙර පැවති රජය විසින් දිවිනැගුම දෙපාර්තමේන්තුව පිහිටුවා සමෘද්ධි නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් හිමිකම තහවුරු කළ බවත්;

(iii) එහෙත් බහුතර සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට මේ වනතෙක් විශ්‍රාම වැටුප් හිමිකම ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඉ) (i) එසේ විශ්‍රාම වැටුප් හිමිකම නොලැබීමට හේතු වූ කරුණු කවරේද;

(ii) එම නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීමේ වැඩපිළිවෙළක් සකස්කර තිබේද;

(iii) එම නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් හිමිකම තහවුරු කරන දිනය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

437/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය වෙනුවෙන් විදුහල්පතිවරුන් හා ගුරුවරුන් විශාල සේවාවක් සිදුකරන බවත්;

(ii) විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ වැටුප් විෂමතාවයන් පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට වැටුප් ගෙවීම වෙනුවෙන් වාර්ෂිකව වැයවන මුදල දළ වශයෙන් කොපමණද;

(ii) විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ වැටුප්වල පවතින විෂමතාවයන් ඉවත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වැඩපිළිවෙලක් සකස්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

479/2020

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරම්භ කර ඇති පාලම් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් වැඩ නිම කර ඇති පාලම් සංඛ්‍යාව;

(iii) මේ වනවිට වැඩ අවසන් කර නොමැති පාලම් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වැඩ අවසන් නොවූ පාලම්වල වැඩ අවසන් කරන දිනය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

499/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති මහවැලි කලාපයන්ට අයත් ගම්මාන අතරින් බලපත්‍ර නොමැති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් සඳහා බලපත්‍ර ලබා නොදීමට හේතුව කවරේද;

(iii) බලපත්‍ර නොමැති ඉඩම් සඳහා බලපත්‍ර ලබා දීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මහවැලි කලාපයට අයත් ඉඩම් සඳහා බලපත්‍ර ලබා නොදීම හේතුවෙන් පැන නැගී ඇති ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

639/2020

ගරු රවුෆ් හකීම් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ ආඥා පනත අනුව යම් භූමියක් සංරක්ෂිත වනාන්තරයක් ලෙස ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කිරීමට සම්පූර්ණ විය යුතු මූලික අවශ්‍යතා කවරේද;

(ii) වන සංරක්ෂණ ආඥාපනත යටතේ මේ දක්වා ප්‍රකාශයට පත්කර ඇති රක්ෂිත වනාන්තර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් වනාන්තරය, රක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත්කළ දිනය, එයට අයත් වන භූමි ප්‍රමාණය හා අදාළ සිතියම් පිළිබඳ සියලු විස්තර දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?